# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2016 අංක 5 දරන කාලාවරෝධ
## (විශේෂ විධිවිධාන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2016 අප්‍රේල් මස 26 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2016 අප්‍රේල් මස 29 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2016 අප්‍රේල් මස 26 වැනි දින]

එල්.ඩී.—ඕ. 21/2010.

**ශ්‍රී ලංකාවේ පැවති යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම් හේතුකොටගෙන අධිකරණයේ දී ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ නීතිමය විධිවිධාන සැලැස්වීමට හැකිවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද වූ පනතකි.**

පූර්විකාව.

1983 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2009 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම් හේතුකොටගෙන ඇතැම් තැනැත්තන් අවාසි සහගත තත්ත්වයන්ට පත් වූ හෙයින් ද, එම නිසා අධිකරණයේ දී ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට එම තැනැත්තන්ට නොහැකි වූ හෙයින් ද:

එවැනි තැනැත්තන්ට අධිකරණයේ දී සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරවා ගැනීමට හැකිවීම පිණිස විශේෂ නෛතික විධිවිධාන පැනවීමට දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකුගේ ඉඩම් ඇතුළු නිශ්චල දේපළ සඳහා නඩු පැවරීමේ අයිතිය.

**2.** (1) ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා නඩු පැවරීමට යම් තැනැත්තකුට අයිතිවාසිකම් උපචිත වූ අවස්ථාවේ දී එම තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වූයේ නම්, එසේ මුලින් සඳහන් කළ තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වශයෙන් සිටිනතාක් දුරට, වෙනත් යම් තැනැත්තකු විසින් ඉඩම් ඇතුළු ඉහත කී නිශ්චල දේපළේ සන්තකය දැරීම මගින්, එසේ සන්තකය දැරීම ප්‍රකාරව ඉඩම් ඇතුළු

ඉහත කී නිශ්චල දේපළේ සන්තකය දැරීම මගින්, එසේ සන්තකය දැරීම ප්‍රකාරව ඉඩම් ඇතුළු එම නිශ්චල දේපළට (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 3 වන වගන්තියේ දැක්වෙන යම් අයිතිවාසිකමක් එම තැනැත්තාට ලැබෙන බවට සලකනු නොලැබිය යුතු ය.

*නිදර්ශන*

"ඒ" අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වී සිටින කාලයේ "බී" විසින් "ඒ" ට අයත් ඉඩමේ සන්තකය දැරීම ආරම්භ කරනු ලබයි -"ඒ" අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වී සිටින තාක් කල් "ඒ" ට එරෙහිව කාලාවරෝධය ආරම්භ නොවනු ඇත.

(2) (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 13 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඉඩම් ඇතුළු නිශ්චල දේපළක් සඳහා හිමිකම් පාන යම් තැනැත්තකු හෝ එම තැනැත්තා හිමිකම් පාන්නේ කවුරුන් යටතේ ද, එම තැනැත්තා විසින් එකී ඉඩම ඇතුළු නිශ්චල දේපළ අවුරුදු තිහක කාලයක් සඳහා ප්‍රතිවිරුද්ධව සහ බාධාවකින් තොරව සන්තකය දැරීම මගින්, එසේ ප්‍රතිවිරුද්ධ සහ බාධාවකින් තොරව සන්තකය දැරූ බවට හිමිකම් පානු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු නම්, (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 3 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට, එසේ සන්තකය දැරීම අවසානාත්මක සාක්ෂියක් ලෙස නොසැලකිය යුතු ය.

සැක දුරුකිරීම.

3. අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු මිය ගියහොත්, ඔහු එසේ අවාසි සහගත තත්ත්වයට පත්ව සිටි කාලසීමාව ඔහුගේ උරුමකාරයාගේ හෝ උරුමකාරයන්ගේ ප්‍රතිලාභයට එකතු විය යුතු අතර, ඒ අනුව මේ පනතේ 2 වන වගන්තිය යටතේ අවාසි සහගත තත්ත්වයකට පත් වූ තැනැත්තකුට ප්‍රදානය කරනු ලබන ප්‍රතිලාභ

ලබා ගැනීමට එම තැනැත්තාගේ උරුමකාරයාට හෝ උරුමකාරයන්ට හිමිකම් ඇති බවට සැකදුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**4.** ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබා ගැනීම සඳහා සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරගැනීමට නොහැකි වූ අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකුට මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු වසර දෙකක් තුළ මේ පනත මගින් පිරිනමනු ලබන ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස නඩු පැවරීමට හිමිකම් ඇත්තේ ය.

මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක් තුළ මේ පනතේ ප්‍රතිලාභ ලබාගැනීම පිණිස අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකුට හිමිකම් ඇති බව.

**5.** මේ පනතේ විධිවිධාන, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත, 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත හෝ (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනත යටතේ ප්‍රදානය කරන ලද ඉඩම් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

පනතේ විධිවිධාන රජයේ ඉඩම්වලට අදාළ නොවිය යුතු බව.

**6.** මේ පනතේ -

අර්ථ නිරූපණය.

''සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම්'' යන්නෙන්, 2013 අංක 3 දරන පනතින් සංශෝධිත 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතෙහි ''ත්‍රස්තවාදී ක්‍රියාව'' යනුවෙන් අර්ථ දක්වා ඇති යම් ක්‍රියාවක් අදහස් වේ;

"අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තා" යන්නෙන්, 1983 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 2009 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම් හේතුවෙන් පැවති අවස්ථානුගත කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන්, නීතියෙන් සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරවා ගැනීමට හැකියාව පැවති අධිකරණයක දී සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කරගනු ලැබීමට නොහැකි වූ යම් තැනැත්තකු අදහස් වේ.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.